## පවුල් සැලසුම් නික්ෂේපණය නිසා ඇති විය හැකි ප්‍රධාන අතුරු ආබාධ මොනවාද?

- මාසික ඔසප් වීම අක්‍රමික වීම: මාස කිහිපයක් යන විට වැඩි දෙනෙකුගේ මෙම තත්ත්වය මඟ හැරී යයි

**මාස කිහිපයක් මාසික ඔසප් වීම සිදු නොවිය හැකිය. මෙය ගැටළුවක් නොවේ.**

අතුරු ආබාධ ඇතිවේ නම් ළඟම සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී හෝ පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනිය හමුවන්න

## පවුල් සැලසුම් නික්ෂේපණය ලබා නොදිය යුතු ප්‍රධාන අවදානම් අවස්ථා

- ගර්භණී සමය හා පසු ප්‍රසව සමයේ සති 6 ක් ගත වන තුරු
- හෘද රෝග/රුධිර සංසරණ පද්ධතිය ආශ්‍රිත රෝගාබාධ හෝ ඒ සඳහා බහු අවදානම් තත්ත්වයන් ඇති විට
- දැනට පියයුරු පිළිකා රෝග තිබීම
- සංකූලතා සහිත හෝ අවුරුදු 20 කට වඩා පවතින දියවැඩියාව
- අක්මාව ආශ්‍රිත පිළිකා

## පවුල් සැලසුම් නික්ෂේපණය කොතරම් කලක් භාවිතා කළ හැකිද?

අවදානම් සාධක කිසිවක් නොමැති නම් ආර්තවහරණය දක්වා (එනම් ඔසප් චක්‍රය නතර වනතුරු) වුවද භාවිතා කළ හැකිය



### වැඩිදුර උපදෙස් සඳහා හමුවන්න

- සෞඛ්‍ය වෛද්‍ය නිළධාරීන්
- වෛද්‍ය නිළධාරීන්
- ලියාපදිංචි වෛද්‍ය නිළධාරීන්
- මහජන සෞඛ්‍ය හෙද සොහොයුරියන්
- පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනියන්

**සුවසැරිය ✆ 1999**

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ, පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ සහ සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ ප්‍රකාශනයකි**

නිසි කල රිසි ලෙස
දරු සම්පත

# ප්‍රීතිමත් යුග දිවියක් උදෙසා...



# පවුල් සැලසුම් නික්ෂේපණය

(ඩිපෝ ඉන්ජෙක්ෂන්)

පහසුයි, ඉතා සාර්ථකයි

## පවුල් සැලසුම් නික්ෂේපණය යනු කුමක් ද?

- මෙය තාවකාලික පවුල් සැලසුම් ක්‍රමයකි
- ස්ත්‍රී හෝර්මෝනවලට සමාන සංයෝගයක් වන ප්‍රොජෙස්ටජන් අඩංගු නික්ෂේපණයකි
- මෙහි  අඩංගු හෝර්මෝන මාස 3 ක කාලයක් ක්‍රියාකාරීව පවතී



## පවුල් සැලසුම් නික්ෂේපණය භාවිතය මගින් ගැබ් ගැනීමක් වළක්වන්නේ කෙසේද?

මෙය කිහිප ආකාරයකින් සිදුවේ

- ඩිම්බ (ස්ත්‍රී බීජ) මේරීම හා පිටවීම වැළැක්වීමෙන්
- ගැබ්ගෙල ශ්‍රාවයන්හි ඝනකම වැඩි කර ශුක්‍රාණු ගර්භාෂය තුළට ඇතුල්වීම අපහසු කිරීමෙන්

## පවුල් සැලසුම් නික්ෂේපණය වඩාත් සුදුසු කාහටද?

- කිරිදෙන මව්වරුන් සඳහා (ප්‍රසූතියෙන් සති 6කට පසුව)
- දරු උපත් අතර නිසි පරතරයක් තබා ගැනීම සඳහා
- ස්ථිර පවුල් සැලසුම් ක්‍රමයකට යොමු වනතෙක් තාවකාලික ක්‍රමයක් අවශ්‍ය කාන්තාවන් සඳහා
- පවුල සම්පූර්ණ කර ඇති කාන්තාවන් සඳහා
- ඊස්ට්‍රජන් සහිත පවුල් සැලසුම් ක්‍රම නුසුදුසු කාන්තාවන් සඳහා
  උදා:  ගැඹුරු ශිරා ශ්‍යානිය (deep vein thrombosis) ඇති විට

## පවුල් සැලසුම් නික්ෂේපණය ගැනීම ආරම්භ කළ හැකි අවස්ථා මොනවාද?

- ඔසප්වීම සිදුවන කාන්තාවකට මුල් දින 7 ඇතුලත
- දරු උපතකින් පසු පළමු සති 6 අවසන්වූ විගස
- වෙනත් පවුල් සැලසුම් ක්‍රමයක් නිසි ලෙස භාවිතා කරමින් සිටී නම් එම ක්‍රමය නැවැත්වූ විගස
- ගර්භණී නොවන බව නිශ්චිතවම තහවුරු කරගත් ඕනෑම අවස්ථාවක



## ඊළඟ නික්ෂේපණය ලබා ගත යුත්තේ කෙතරම් කාලයකින්ද ?

මාස 3 කට වරක් ලබාගත යුතුය

## නැවත සරුභාවයට පත්වීමට කොතරම් කාලයක් ගත වේද?

සාමාන්‍යයෙන් අනෙකුත් ක්‍රම වලට සාපේක්ෂව මාස හතරක් පමණ ගතවේ.

එම කාලය කාන්තාවකගෙන් කාන්තාවකට වෙනස්  විය හැකිය

## යම් හෙයකින් නියමිත දිනට නික්ෂේපණය ලබා ගැනීමට අතපසු වුවහොත් කුමක් කළ යුතුද?

වහාම සෞඛ්‍ය වෛද්‍ය  නිළධාරී හෝ පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනියගෙන් උපදෙස් ලබා ගන්න. එතෙක් ලිංගික සංසර්ගයේ යෙදේ නම් රබර් කොපු (කොන්ඩම්) භාවිතා කරන්න

**ගැබ් ගැනීමක් වලක්වා ගැනීමට අවශ්‍ය බොහෝ කාන්තාවන්ට මෙම ක්‍රමය සුදුසුය**